ඒකාබද්ධ සේවා චක්‍රලේඛ: 06/2007

මගේ අංකය:PA/CS/6/PMAS III/පරි.පුහුණු,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2007 නොවැම්බර් මස 09 වන දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන්,

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 වගන්තිය යටතේ පරිගණක හැකියාව විමසන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන නිලධාරීන්ට පුහුණු දීමනා ප්‍රතිපූරණය කිරීම.**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 හා 5:1:2 උප වගන්තිවල නියම කර ඇති පරිදි පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත්වීමට හෝ පිළිගත් සහතික ඉදිරිපත් කර විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීමට අදාළ විධිවිධාන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධරයන්ට නියම කර ඇත.

02. ඉහත කී අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන්ට තම පරිගණක දැනුම වර්ධනය කර ගැනීම සඳහා දරන ලද පුහුණු වියදම් ප්‍රතිපූරණය කිරීමක් ලෙසට රුපියල් 7000/- ක දීමනාවක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම දීමනා ගෙවීම පහත දැක්වෙන ආකාරයට සිදුකළ යුතුය.

(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන් පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත් වූ බවට / ව්‍යවස්ථාවේ 5:1:2 ඡේදය අනුව විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන ලිපියක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීට පිටපතක් ඇතිව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරනු ඇත. ඒ අනුව ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රතිපාදන සලසා දුන් පසුව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එම දීමනා ගෙවිය යුතුය. එලෙස ගෙවන මුදල ප්‍රතිපාදන වෙන් කර දෙන වැය විස්තර යටතේ වියදම

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත මාසික ගිණුම් සාරාංශය මගින් එම වියදම දරන මාසය අවසානයේ දී වාර්තා කල යුතුය. එම වියදම දරන ලද මාසයේ දී ඒ පිළිබඳ හර නිවේදනය ප්‍රධාන ගණකාධිකාරී, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා එවිය යුතුය.

(ආ) ගෙවීම් කිරීමෙන් පසු ගෙවීම් කළ බවට සහතිකයක් නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කළ යුතු අතර තවත් පිටපතක් ප්‍රධාන ගොනුවට ඇතුලත් කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල් වෙත එවිය යුතුය.

(ඇ) මෙම ගෙවීම් ක්‍රමය වලංගු වනුයේ නිලධාරියාගේ පත්වීම් දිනයේ සිට පරිගණක දැනුම පිළිබඳ ලිඛිත විභාග පැවැත්වූ වාර 06 දක්වා පමණක් වන හෙයින් නිලධාරියා ගෙවීම් ලැබීමට හිමිකම් ලබන බවට තිකුත් කරන සහතිකයේ ඒ දක්වා පවත්වන ලද විභාග වාර ගණන සඳහන් විය යුතුය.

(ඈ) 2004.01.01 දින හෝ ඊට පසු දිනක සිට බල පවත්වන ලද පත්වීම්ලාභීන් සඳහා පමණක් මෙම දීමනා හිමි වේ.

(ඉ) ගෙවීම් අනුමත කළ නිලධාරීන්ගේ ලේඛණයක් අදල බලධරයා විසින් පවත්වා ගෙන යායුතු වේ.

04. මෙම දීමනා ගෙවනු ලබන්නේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය අනුව ආරම්භක පුහුණු අවස්ථා සැලසීමේ විකල්පයක් වශයෙන් වන හෙයින් නිලධාරීන් තමන් කැමති ඕනෑම පෞද්ගලික හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් මුදල් ගෙවා පුහුණුව ලබා ගෙන ව්‍යවස්ථා සංග්‍රහයේ 5:1 හෝ 5:1:2 ජේදය යටතේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

ඒ.නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.